23 වන පිටෙන්

ඝනකම පාෂාණ තට්ටුවක් තිබුණා. ඒ පාෂණ තට්ටුව මීටර් සියක් පමණ ගැඹුරට හෑරුවා. ඒ අනුව ඝන මීටර් මිලියන හතළිහක විතර ප්‍රමාණයක ඛනිජ නිධිය පැතිරලා තියෙනවා. ඒ කලාපය තුළ විතරක් ටොන් මිලියන අසූවක පමණ ඛනිජ සම්පත් තියෙනවා කියලා අපි අනුමාන කරනවා. ඒ ඛනිජ නිධියේ තඹ, යකඩ, රත්තරන් වගේම ලොව වටිනාම ලෝහ වන ෆ්ලැටිනම් ෆ්ලේඩියම් ඛනිජත් තියෙනවා. ඒ, ඒ කලාපවල විවිධ මට්ටම්වලින් ඛනිජ පිහිටලා තිබුණා. අපි හඳුනාගත්තේ මීටර් හැට හැත්තෑවක ගැඹුරින් තියෙන ඛනිජ නිධියේ ලෝහ වර්ග කිහිපයක් විතරයි. ලෝකයේ රත්තරන් නිධි මීටර් තුන්සිය, හාරසීය ගැඹුරට විහිදෙනවා. මේ රත්තරන් නිධියත් තව ගැඹුරට පැතිරිලා තියෙන බව තහවුරු වෙලා තියෙනවා. මීටර් එකසිය පහළොවකින් විතර තවත් ඛනිජ තට්ට්ටුවක් අපට හමුවුණා. ප්‍රතිපාදන නැති නිසා ඒ කලාපයට වෙනකම් අපි හෑරුවේ නෑ...''



''2019 අවුරුද්දේ පෙබරවාරි, මාර්තු වෙනකොට මූලික ගවේෂණ කටයුතු අවසාන කරලා, එම පර්යේෂණ වාර්තා භූ විද්‍යා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන්න අපිට අවස්ථා ලැබුණා. ඒ අවස්ථාවට අදාළ සියලුම පාර්ශ්ව කැඳවන්න කියලා මම ඉල්ලීමක් කළා. ඛනිජ සම්පත් ගවේෂණය භූ විද්‍යා, පතල් කාර්යාංශයට පමණක් සීමා වෙච්ච කටයුත්තක් නෙමෙයි. ඒ කටයුත්තට අදාළ ආයතන, නිලධාරීන් විශාල පිරිසක් ඉන්නවා. ගවේෂණය කරන්නේ පොළොවේ. මිනිසුන් ජීවත් වන ප්‍රදේශවල හෝ කැලෑ ප්‍රදේශවල. ඒ ඒ ක්ෂේත්‍ර පාලනය වන ආයතන තියෙනවා. වෙනම නීති තියෙනවා. නිලධාරීන් ඉන්නවා. ඛනිජ සම්පත්වල තියෙන වටිනාකම ගැන ඒ අයත් දැනුවත් වෙන්න ඕනෑ. එහෙම නොවෙන්න ඛනිජ සම්පත් ගවේෂණයේදී ඒ ආයතනවලින් සහ නිලධාරීන්ගෙන් අපිට ගැටලු මතු වෙනවා. ඒ නිසා ඛනිජ සම්පත් පිළිබඳ අධ්‍යක්ෂ ජෙනරාල්, පරිසර අමාත්‍යාංශයේ නියෝජිතයෙක්, වනජීවී අධ්‍යක්ෂ ජෙනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් අදාළ සියලු ආයතනවල නිලධාරීන් එක තැනකට එකතු කරලා අපි වාර්තාව ඉදිරිපත් කළා. ඒ සියලු නිලධාරීන් අපේ වාර්තාව පිළිගත්තා. කිසිදු ගැටලුවක් මතු වුණේ නෑ. ඒත් අපි මේ වාර්තාව සමාජගත කළේ නෑ. දැන් නියම කාලය ඇවිත් තියෙන නිසා ප්‍රථම වතාවට රත්තරන් සොයාගත්ත කතාව මාධ්‍යයට කිව්වා...''

''සේරුවාවිල ප්‍රදේශයෙන් අපි සොයාගෙන තියෙන රත්තරන් ප්‍රමාණාත්මකව වෙනස් වෙනවා. සමහර නියදිවල පාෂාණයේ ටොන් එකකට රත්තරන් ග්‍රෑම් නවයක් දහයක් තියෙනවා. තව සමහර නියදිවල ටොන් එකකට රත්තරන් ග්‍රෑම් පහයි, හයයි. එවැනි ප්‍රමාණයන් තියෙනවා කියන්නේ ආර්ථික වශයෙන් වටිනා නිධියක ලක්ෂණ. ඉන්දියාව, බුරුමය, තායිලන්තය වැනි රටවල ආර්ථික වශයෙන් ක්‍රියාත්මක රත්තරන් නිධිවල ටොන් එකට රත්තරන් ග්‍රෑම් 0.5 තියෙන නිධිත් කැණීම් කරනවා. ලංකාවේ අපි සොයාගත්ත රත්තරන් නිධියේ ටොන් එකට ග්‍රෑම් පහ, නවය තියෙනවා. ආර්ථික වටිනාකම ඉතාම ඉහළයි. ඒත් මේ ගවේෂණ කටයුතුවලට රජයෙන් කිසිම සහයෝගයක් ලැබුණේ නෑ. මහා පරිමාණ ව්‍යාපාරිකය-න්ගෙනුත් සහයෝගය ලැබුණේ නෑ. දැන් මේ ඛනිජ නිධියේ රත්තරන් තියෙන බව තහවුරු වෙලා තියෙන නිසා ඉදිරියට කෙරෙන ගවේෂණ කටයුතුවලට ප්‍රතිපාදන ලබාදීමට ආයෝජකයන් පොරකන තත්ත්වයට පත් වෙලා. ඒත් රත්තරන් කර්මාන්තයක් ඇති කිරීමේදී මූලික පිරිවැය පමණක් ඩොලර් මිලියන තුන්සීයක් විතර වැය වෙනවා. රත්තරන් නිස්සාරණය කරලා රත්තරන් කැට එළියට ගන්න විතරක්. රත්තරන් කර්මා-න්තය ඒ තැනට ගේන්න දැන් ව්‍යාපාරිකයෝ ආයෝජනය කරයි. ඉතා නුදුරේදී දෙවැනි අදියරේ ගවේෂණ කටයුතු අපි ආරම්භ කරනවා...''

''මේවා මීට කලින් වෙන්න තිබුණු ව්‍යාපෘති. ඒත් අපේ රටේ ඛනිජ සම්පත් ගවේෂණයට කිසිම රජයක් උනන්දු වුණේ නෑ. ඛනිජ සම්පත්වල වටිනාකම, ඛනිජ සම්පත් සොයා ගැනීමෙන් රටට ලැබෙන ප්‍රතිලාභ ගැන කිසිම රජයක් සැලකිලිමත් වුණේ නෑ. ලෝකයේ දියුණු රටවල ප්‍රධාන ආදායම් මාර්ගය වෙලා තියෙන්නේ මොනවද? ඇමෙරිකාවේ ජාතික ආර්ථිකයට එරට ඛනිජ සම්පත්වලින් 18% ක දායකත්වයක් ලැබෙනවා. චිලී රටේ ජාතික ආර්ථිකයට ඛනිජ සම්පත්වල දායකත්වය සියයට තිස්අටයි. බොට්ස්වානාවල ඛනිජ සම්පත්වල දායකත්වය සියයට හැටක්. අපේ රට පුංචි දූපතක් වුණත් ඛනිජ සම්පත් තියෙන ප්‍රමාණය වැඩියි. ඒත් අපේ රටේ නිධන්ගත ඛනිජ සම්පත් රටේ ආර්ථිකයට සම්පතක් කර ගන්න බැරි වුණා. සොබාදහම රටට ලබා දීලා තියෙන සම්පත් ප්‍රයෝජනයට ගන්න අපේ රටට නිවැරැදි ප්‍රතිපත්තියක් තිබුණේ නෑ...'' පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති මහාචාර්ය අතුල සේනාරත්න මහතාගේ රත්තරන් කතාව අවසානය. මහාචාර්යවරයාගේ පර්යේෂණ සම්බන්ධයෙන් තවත් තොරතුරු ලබාදීමේ බලාපොරොත්තුවෙන් ඔහු නිහඬ විය. නිදහසින් පසු මෙතෙක් කාලයකට මේ රන් පොළොව යට නිධන්ගත ඛනිජ සම්පත් කැණීම් කොට රටේ ආර්ථිකයට සම්පතක් කරගැනීමට තරම් දූරදර්ශී දෑහිතකාමී නායකයන් බිහිනොවීම අපේ රටේ කරුමයකි. එහෙත් යටගියාවට චෝදනා නැඟීම නිෂ්ඵල ක්‍රියාවකි. එහෙයින් ඒ අවාසනාවන්ත කාලපරිච්ඡේදයන් අමතක කොට සේරුවාවිල ප්‍රදේශයෙන් සොයාගෙන ඇති රත්තරන් ඇතුළු ඛනිජ නිධිය නිස්සාරණය කිරීම පවතින රජයේ ප්‍රමුඛ කාර්යභාරයකි.

එමෙන්ම පවතින රජයට එම රාජකාරිය පසෙකට දැමීමට ද නොහැකිය. සේරුවාවිල ප්‍රදේශයේ ඛනිජ ගවේෂණයේ නිරත වූ මහාචාර්ය සේනාරත්න මහතා දැන් ඒ 'රත්තරන්' කතාව සමාජගත කර අවසානය. දැන් අප බලා සිටින්නේ රජයේ අදාළ පාර්ශ්වයෙන් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන වේගය දෙසය. එමෙන්ම වාර්තා වන අන්දමට මේ වන විටත් සේරුවාවිල රත්තරන් නිධිය බදුගැනීමේ අදහසින් කැනඩා සමාගම් දෙකක නියෝජිතයන් කිහිපදෙනෙක් ලංකාවට පැමිණ සිටිති. එහෙයින් 'වත්ත බද්දට දී ඇස්සට දත නියවන' තත්ත්වයක් සේරුවාවිල රත්තරන් නිධියට උදානොවේවායි යන්න අපගේ ප්‍රාර්ථනාවයි.




